**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍යය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2021

ඔක්තෝම්බර් - 2023

# BMGT E1045 - ව්‍යාපාර නීතිය

ප්‍රශ්න සංඛ්‍යාව : අටයි (08) කාලය : පැය 03 යි

**ප්‍රශ්න අංක 01 සහ තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන මුළු ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

## ප්‍රශ්න අංක 01

වඩාත්ම සුදුසු පිළිතුර තෝරා ලබාදී ඇති පිළිතුරු සටහන් කරන පොතේ ලියන්න.

1) පහත සඳහන් නීති ශාඛා අතරින් "සිවිල් නීතියට" ඇතුළත් වේ.

- අ) දේපල නීතිය, පරිපාලන නීතිය සහ සිවිල් නීතිය
- ආ) පුද්ගල නීතිය, තෝරක නීතිය සහ ගිවිසුම් නීතිය
- ඇ) අපරාධ නීතිය, ගිවිසුම් නීතිය සහ කාරමික නීතිය
- ඈ) පරිපාලන නීතිය, දේපල නීතිය සහ ව්‍යාපාර නීතිය.

2) පහත සඳහන් කුමන ප්‍රකාශය අසත්‍යද?

- අ) ගිවිසුමක් යනු නීතියෙන් බලාත්මක කළ හැකි එකඟත්වයකි.
- ආ) සෑම ගිවිසුමක්ම එකඟත්වයකි.
- ඇ) නීත්‍යානුකූලව බැඳී සිටීමට අදහස් නොකරන එකඟත්වයන් ගිවිසුම් නොවේ.
- ඈ) සෑම එකඟත්වයක්ම ගිවිසුමකි.

3) පොදු අර්පනයෙහි වලංගුභාවය පිළිබඳ සුප්‍රසිද්ධ විනිශ්චය වන්නේ

ආ) කාලයිල් එ. කාබොලික් ස්මෝක් බෝල් සමාගම

ආ) හයිඩ් එ. රෙන්ච්

ඇ) නීල් එ. මෙරිට්

ඈ) ෆිෂර් එ. බෙල්

4) වන්දි ගෙවීමට අදාළ පහත සඳහන් ප්‍රකාශවලින් වැරදි ප්‍රකාශය කුමක්ද?

අ) සාමාන්‍ය අලාභය අයකරගත හැක.

ආ) විශේෂ හානි අයකර ගත හැක්කේ පාර්ශ්වයන් එය දැන සිටියේ නම් පමණි.

ඇ) දුරස්ථ පාඩු ආපසු අයකර ගත නොහැක.

ඈ) ඉහත ප්‍රකාශ කිසිවක් නිවැරදි නොවේ.

5) වලංගු නියෝජ්‍යත්වය සබඳතාවයක් නිර්මාණය කිරීමට අවශ්‍ය නොවන පහත සඳහන් මූලිකාංගය කුමක්ද ?

අ) ප්‍රධානියාට ගිවිසුම් කිරීමේ හැකියාව තිබිය යුතුය.

ආ) නියෝජිතයාට ගිවිසුම් කිරීමේ හැකියාවක් තිබිය යුතුය.

ඇ) නියෝජ්‍යත්වය ප්‍රකාශිත හෝ ව්‍යංගයෙන් නිර්මාණය කළ හැක.

ඈ) නියෝජිතයා ක්‍රියා කරන්නේ නියෝජිත ධාරිතාවකින් පමණි.

6) රක්ෂණ. පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

අ) පුද්ගලයන්ගේ ජීවිතය සහ දේපළ නිතර අවදානමට නිරාවරණය වන බැවින් රක්ෂණය අවශ්‍ය වේ.

ආ) රක්ෂණයේ අරමුණ වන්නේ අනපේක්ෂිත සිදුවීම් ඇතිවීම හේතුවෙන් පුද්ගලයෙකුට සිදුවන පාඩු අවම කිරීම සඳහා ප්‍රතිකර්ම රක්ෂණයක් ලබා දීමයි.

ඇ) රක්ෂණය යනු අවිනිශ්චිත සිද්ධීන් හේතුවෙන් පුද්ගලයෙකුට ඔහුට දැරීමට සිදුවන පාඩු වලින් ආරක්ෂා වීමයි.

ඈ) ඉහත සියල්ල නිවැරදි ය.

**7)** ශ්‍රී ලංකාවේ හවුල් ව්‍යාපාර නීතියට අදාළ මූලාශ්‍ර වන්නේ,

අ) 1840 අංක 07 දරන වංචා වැලැක්වීමේ ආඥාපනත

ආ) 1918 අංක 06 දරන ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥාපනත

ඇ) සිවිල් නඩු විධාන සංග්‍රහය

ඈ) මෙහි සඳහන් සියල්ල

8) 2007 අංක 07 දරන සමාගම් පනතට අනුව කොටස් මගින් සීමා කරන ලද සමාගම් කාණ්ඩයට අයත් නොවන්නේ කුමන ඒවාද?

අ) වගකීම් වලින් සීමා වූ සමාගම්

ආ) සීමාසහිත අක්වෙරළ සමාගම්

ඇ) පුද්ගලික සීමිත සමාගම්

ඈ) විදේශීය සමාගම්

9) A තම පාවිච්චි කළ මෝටර් රථය රුපියල් 80,000 කට මෝටර් රථ අලෙවි නියෝජිතයෙකු වන B වෙත විකුණන අතර ඒ සඳහා B ගෙන් රුපියල් 120,000 කට නව මෝටර් රථයක් මිලදී ගනු ලැබේ. A නව මෝටර් රථය සඳහා හිඟ මුදල් මුදලින් ගෙවීමට එකඟ වේ. මෙම ගණුදෙනුව.

අ) විකිණීමේ ගිවිසුමකි.

ආ) විකිණීම සඳහා එකඟත්වයකි.

ඇ) හුවමාරුවකි.

ඈ) භාණ්ඩ සඳහා භාණ්ඩ ලබාදීමකි.

10) 2021 සේවක අවම විශ්‍රාම යන වයස් පනතේ අඩංගු විධිවිධාන අනුව පුද්ගලික අංශයේ ආයතනයක සේවකයෙකුට ලබා දෙන උපරිම පරිවාස කාලය කුමක්ද?

අ) වසර තුනක්

ආ) වසරක්

ඇ) මාස හයක්

ඈ) වසර දෙකක්

(ලකුණු **02 x 10 =** ලකුණු **20)**

ප්‍රශ්න අංක 02

ආ) සමාජය තුළ නීතියේ කාර්යභාරය කුමක්ද?

(ලකුණු 06)

ආ) ශ්‍රී ලංකාව තුළ තේසවලමෙයි නීතිය පුද්ගලික සහ ප්‍රාදේශීය නීතිය ලෙස යෙදීම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඇ) ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලතල නම් කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 03

අ) "ගිවිසුම් නීතියට අනුව බාල වයස්කරුවන්ට වලංගු ගිවිසුමකට එළඹීමට හැකියාවක් නැත. කෙසේ වෙතත්, ඇතැම් සුවිශේෂී අවස්ථා වලදී, බාලවයස්කරුවන් සාදන ගිවිසුම් වලංගු සහ බලාත්මක කළ හැකි යැයි සලකනු ලැබේ". විනිශ්චිත නඩු තීන්දු යොදා ගනිමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ආ) "අගනා ප්‍රතිඡ්ඨාවක්" අතීත, ඉටු කළ සහ අනාගත විය හැකිය". ගිවිසුම් ස්ථාපිත කිරිම උදෙසා මෙම විවිධ වූ අගනා ප්‍රතිඡ්ඨාවන් යෙදෙන අයුරු සුදුසු නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 04

අ) නිමල්ට කොළ පාට සහ නිල් පාට වශයෙන් ට්‍රක් රථ දෙකක් තිබුණි. නිමල් කොළ පැහැති ට්‍රක් රථය බිමල්ට විකිණීමට අර්පනයක් ඉදිරිපත් කළේය. බිමල් ට්‍රක් රථය මිලදී ගැනීමට එකඟ වූ නමුත් ඔහුගේ සිතේ තිබුණේ නිල් පැහැති ට්‍රක් රථයක් මිලදී ගැනීමටය. නිමල්ට සහ බිමල්ට තීරණය කළ නඩු වල සහාය ඇතිව වලංගු ගිවිසුමක් ඇති කර ගත හැකිද යන්න සම්බන්ධයෙන් උපදෙස් දෙන්න.

(ලකුණු 08)

ආ) ඔබ "ගිවිසුම් අවසන්වීම" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? ගිවිසුම් අවසන් කළ හැකි විවිධ ක්‍රම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 12)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 05**

අ) "අපරානුමැතිය" මත ඇතිවන නියෝජ්‍යත්වය යනු කුමක්ද? අපරානුමැතියක් ස්ථාපිත කිරීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි සඳහන් කරන්න.

(ලකුණු 10)

ආ) අමල්, බිමල් සහ සුනිමල් සිල්ලර ව්‍යාපාරයක හවුල්කරුවන් වේ. හවුල් ව්‍යාපාරය වෙනුවෙන් අමල් පහත ක්‍රියා සිදු කරයි.

i. හවුල් ව්‍යාපාරය අයත් ගොඩනැගිල්ලක් විකිණීම.

ii හාණ්ඩ තොගයක් ණය පදනම මත විකිණීම.

iii. හවුල් ව්‍යාපාරයට නව සේවකයින් දෙදෙනෙකු බඳවා ගන්නා ලදී

iv. හවුල් ව්‍යාපාරයේ නමින් විනිමය බිල්පතක් අනුමත කරන ලදී

v. බේරුම්කරණය සඳහා හවුල් ව්‍යාපාරයේ වාණිජ ගනුදෙනුවකට අදාළ ආරවුලක් යොමු කිරීම.

අනෙකුත් හවුල්කරුවන්ගේ නියෝජිතයා ලෙස අමල් විසින් සිදු කරන ලද ඉහත ක්‍රියාවන්හි වලංගුභාවය සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 06**

අ) නිමල් කුකුළු ආහාර විකුණන්නෙකු වන කසුන්ගෙන් කුකුළු ආහාර මිලදී ගත්තේය. මෙම ආහාර ගොවිපලේ සිටි සියලු කුකුලන්ට නිමල් විසින් ලබා දුන් අතර, එහි ප්‍රතිඵලයක්ලෙස කුඩා පැටව් සියල්ල මිය ගියේය. කෙසේ වෙතත්, පසුව සොයා ගන්නා ලද්දේ මෙම ආහාර වැඩිහිටි පක්ෂීන් සහ අනෙකුත් සතුන් සඳහා සුදුසු වන බවයි. දැන් නිමල්ට අවශ්‍ය වී ඇත්තේ එම ආහාර ගැනුම්කරුගේ අරමුණට නොගැලපෙන බව සහ වෙළෙඳාමට සුදුසු තත්ත්වයේ නොතිබීම යන පදනම මත කසුන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමටය. මේ සම්බන්ධයෙන් නිමල්ට උපදෙස් දෙන්න.

(ලකුණු 08)

ආ) රක්ෂණයේ මූලික මූලධර්ම උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 12)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 07**

අ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතේ දක්වා ඇති පාරිතෝෂිකය ගණනය කිරීමේ විවිධ ක්‍රම මොනවාද?

(ලකුණු 06)

ආ) රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වෘත්තීය සමිති ලියාපදිංචියට බලපාන විශේෂ සීමාවන් මොනවාද?

(ලකුණු 05)

ඇ) ලියාපදිංචි වෘත්තීය සමිතියක් විසින් භුක්ති විඳින අයිතිවාසිකම් සහ වරප්‍රසාද මොනවාද?

(ලකුණු 05)

ඈ) අනියම් සේවකයින්ගේ ප්‍රධාන ලක්ෂණ මොනවාද?

(ලකුණු 04)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 08**

අ) සාප්පු සහ කාර්යාල සේවක පනත යටතේ අර්ථ දක්වා ඇති "සාප්පු" සඳහා උදාහරණ හතරක් දෙන්න.

(ලකුණු 04)

ආ) 2018 අංක 14 දරණ සාප්පු සහ කාර්යාල සේවකයන් (රැකියා සහ වේතන නියාමනය) (සංශෝධන) පනතට අනුව සේවිකාවකට ලබා දී ඇති මාතෘ ප්‍රතිලාභ පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ) කාර්මික ආරවුල් විසඳීමට අදාළව කාර්මික ආරවුල් පනතේ විස්තර කර ඇති විවිධ විකල්ප ක්‍රම නම් කරන්න.

(ලකුණු 06)

ඈ) සේවකයෙකු තම අර්ථසාධක ගිණුමේ මුදල් ලබා ගැනීමට සුදුසුකම් ලබන අවස්ථා පහක් සඳහන් කරන්න.

(ලකුණු 05)

**(මුළු ලකුණු 20)**